**සමාගම් ගිණුම් අභ්‍යාස අංක 01**

1.සීමිත වාසනා සමාගමේ පොත්වලින් 2020.03.31 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| විකුණුම් | | 12,000 |
| 2019.04.01 තොගය | 400 | |
| ගැනුම් | 6,900 | |
| ලද බදු කුලී ආදායම | | 190 |
| ආයෝජන ආදායම් | | 50 |
| සේවක වැටුප් | 700 | |
| අධ්‍යක්ෂක පාරිශ්‍රමික | 500 | |
| විගණන ගාස්තු | 100 | |
| බොල් ණය | 50 | |
| හානිකරන අලාභ ඉඩ හැරීම | | 30 |
| ණයකර පොලී | 110 | |
| විකුණුම් කොමිස් | 350 | |
| පරිපාලන වියදම් | 230 | |
| 12% ණයකර | | 1,000 |
| ලද වට්ටම් | | 100 |
| 2019.04.01 ආදායම් බදු වෙන්කිරීම | | 200 |
| ගෙවූ ආදායම් බදු | 300 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 580 | |
| ගෙවිය යුතු දෑ | | 100 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අගයට | 5,500 | |
| මෝටර් රථ | 3,800 | 630 |
| කාර්යාල උපකරණ | 3,000 | 300 |
| කල්බදු ගෙවීම් | 580 | |
| සා.කො. ප්‍රාග්ධනය (50,000) | | 5,000 |
| 10% ආයෝජනය | 1,000 | |
| පොදු සංචිත | | 850 |
| රඳවාගත් ලාභ | | 1725 |
| බැංකු | | 975 |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 950 |
| | **24,100** | **24,100** |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

<u>අතිරේක තොරතුරු</u>

1) 2020.03.31 දිනට තොගය පිරිවැය රු. 300,000 කි. ඒ තුළ රු. 20,000 ක හානි වූ තොගයක් ඇති අතර රු. 5,000 විකුණුම් වියදමක් දරා එය රු. 15,000 ට විකිණීමට අපේක්ෂිත වේ.
2) ව්‍යාපාරයට අයත් ව තිබූ ඉඩමක 2018 වසරේ සිට මසකට රු. 10,000 බැගින් බද්දට දී තිබේ. 2020 ජනවාරි මාසයේ සිට මෙහි බදු කුලිය රු. 20,000 දක්වා ඉහල දමන ලදි.
3) හානිකරණ අලාභ ලෙස තව රු. 10,000 ක් කපා හැරිය යුතුය. වෙළඳ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම 10% ක් වශයෙන් ගැලපිය යුතු ය.
4) 2020.03.31 දිනට ආයෝජන වල වෙළඳපොළ අගය රු. 1,200,000 ක් විය. අධ්‍යක්ෂකවරුන් මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද්දේ 2020.07.20 දින දී ය.
5) 2020.01.01 දින රු. 500,000 ක් දරමින් කාර්යාලයේ පාවිච්චිය වෙනුවෙන් නව උපකරණයක් මිලදී ගන්නා ලදි. කෙසේ වුවත් මෙය ගැනුම් ලෙස වාර්තා කර ඇත. කාර්යාලය උපකරණ 5% බැගින් ද මෝටර් රථ 10% බැගින් ද ක්ෂය කරනු ලැබේ. (කල්බද්දට ගත් මෝටර් රථය හැර)
6) 2019.04.01 දින කල්බදු පදනමට භාණ්ඩ බෙදාහැරීමේ කටයුතු සඳහා මෝටර් රථයක් අත්පත් කරගෙන ඇත. ඒ පිළිබඳ පහත තොරතුරු සපයා ඇත.
   - අනාගත කල්බදු ගෙවීම් වල වර්තමාන අගය රු. 507,040
   - සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදී ම ගෙවිය යුතු කල්බදු වාරිකය රු. 160,000
   - ප්‍රවර්තන වසරට අදාළ කල්බදු පොළිය රු. 50,704 ක් ද 2020/2021 වර්ෂයට අදාළ කල්බදු පොළිය රු. 39,44 ක් ද වේ.
   - මෝටර් රථයේ ඵලදායි ජීවකාලය වසර 5 කි. කල්බදු කාලය වසර 4 කි. භාවිත අයිතිය ඇති වත්කමේ අයිතිය කල්බදු කාලය අවසානයේ දී ගැනුම්කරුට මාරු නොවේ.
   - 2019.04.01 දින මූලික ගෙවීම් ලෙස රු. 400,000 ක් ගෙවා ඇති අතර එදිනට ගෙවූ සෘජු වියදම රු. 20,000 කි. 2020.03.31 දිනට වාර්ෂික වාරිකයද ගෙවා ඇත. මෙම සියලුම ගෙවීම් කල්බදු ගෙවීම් ගිණුම හර කර ඇත. ඒ හැර වෙනත් කිසිදු ගැළපීමක් කර නැත.
7) 2020.03.31 දින ඉඩම නැවත ප්‍රත්‍යාගණනය කර ඇත. එහි දී එය රු. 5,400,000 කට ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම ඉඩම පෙර ප්‍රත්‍යාගණනයක දී රු. 150,000 ක අලාභයක් ලබා ඇත.
8) සේවයෙන් ඉවත්කරන ලද සේවකයකු රු. 500,000 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. මූල්‍ය වාර්තා සකස් කරන දින වන විටත් එම නඩුව විභාග වෙමින් පැවති අතර වන්දි ගෙවීමට අවශ්‍යතාවයක් පැන නොනගී යයි නීතීඥවරු පැවසීය.
9) වසර තුළ දී ගෙවූ ආදායම් බදු වලින් රු. 150,000 ක 2018/2019 වර්ෂය සඳහා වේ. 2019/2020 වර්ෂයේ ආදායම් බද්ද රු. 300,000 කට ඇස්තමේන්තු කර ඇත.
10) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2020.03.31 දින පහත තීරණ ගෙන ඇත.
   - 2020.03.31 දින තිබූ සෑම කොටස් 100 කට 1 බැගින් රු. 100 ක් වූ ප්‍රතිෂ්ඨාවකට පොදු සංචිත භාවිතයෙන් ප්‍රසාද නිකුතුවක් කිරීම.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**<u>අවශ්‍ය වන්නේ,</u>**

LKS 01 ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත වාසනා සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව) සකස් කරන්න.

1. 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.
2. 2020.03.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
3. 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## පිළිතුරු

අභ්‍යාස 01

### සීමිත වාසනා පොදු සමාගමේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීරන ආදායම ප්‍රකාශය

| විස්තරය | රු. '000 | රු. '000 |
|---|---|---|
| විකුණුම් | | 12,000 |
| විකුණුම් පිරිවැය | | (6,500) |
| දළ ලාභය | | 5,500 |
| වෙනත් ආදායම් 1 | | 350 |
| | | 5,850 |
| බෙදාහැරීමේ පිරිවැය | 1,048,76 | |
| පරිපාලන වියදම් | 1691.25 | |
| වෙනත් වියදම් | 110 | |
| මූල්‍ය පිරිවැය | 170.704 | (3,020.714) |
| බදු පෙර ලාභය | | 2829.286 |
| ආදායම් බදු | | (250) |
| කාලච්ඡේදයේ ලාභය | | 2,579.286 |
| වෙනත් විස්තීරණ ආදායම් | | |
| | | |
| මුළු විස්තීරණ ආදායම | | 2,579.286 |

#### සටහන්

**සටහන 01** (රු. '000)

වෙනත් ආදායම්

| | |
|---|---|
| බදු කුලී ආදායම | 150 |
| ආයෝජන ආදායම | 100 |
| ලද වට්ටම් | 100 |
| | 350 |

**සටහන 02**

බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම්ද අඩු කරය.

| | |
|---|---|
| අධ්‍යක්ෂක ගාස්තු | 500 |
| විගණන ගාස්තු | 100 |
| තොග කපාහැරීම | 10 |
| කල්බදු පොළී | 50,704 |
| මාසික පොළිය | 150 |

**සටහන 03**

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු බද්ද | | 300 |
| අධි බදු වෙන්කිරීම | (50) | = 250 |

### සීමිත වාසනා පොදු සමාගම 202.03.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| | සා.කොටස් | පොදු සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|
| 2019.04.01 ට ශේෂය | 8,000 | 80 | 1,725 | 7,575 |
| සංචිත ප්‍රාග්ධනික කිරීම | 50 | (50) | | - |
| මුළු විස්තීරණ ආදායම | | | 2579,286 | 2,579.286 |
| | 5050 | 800 | 4304.286 | 1,0154.286 |

අන්තර්ගතය : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
සැකසුම : ඩී.එම්. චන්දන කුමාර දිසානායක, පු/ආණ/ශ්‍රී රතනපාල ම.වි. - මහඋස්වැව.
Copyright © www.e-thaksalawa.moe.gov.lk

වාසනා පොදු සමාගම 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| **ජංගම නොවන වත්කම්** | සටහන් | (රු. '000) | (රු. '000) |
|---|---|---|---|
| දේපළ පිරියත උපකරණ | 4 | | 11,228.75 |
| භාවිත අයිතිය ඇති වත්කම් | 5 | | 695.28 |
| ආයෝජන | | | 1,000 |
| | | | 12,924.03 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | | 290 | |
| වෙළඳ ලැබිය යුතු දෑ (570-57) | | 513 | |
| වෙනත් ලැබිය යුතු දෑ | | 50 | 853 |
| මුළු වත්කම් | | | 13,777.03 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සා.කො) | | 5050 | |
| පොදු සංචිත | | 800 | |
| රඳවාගත් ලාභ | | 4,304.28 | 10,154.286 |
| **ජංගම නොවන වගකීම** | | | |
| දිගුකාලීන වගකීම් | | 277.518 | |
| 12% ණයකර | | 1000 | 1,277.818 |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත ආදායම් බදු | | 150 | |
| කල්බදු වගකිම | | 120.226 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 100 | |
| බැංකු | | 975 | |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 1000 | 2,315.226 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 13,377.03 |


Copyright © www.e-thaksalawa.moe.gov.lk

4) දේපළ පිරියත උපකරණ

| පිරිවැය | ඉඩම් | මෝටර් රථ | කාර්යාල උපකරණ | එකතුව |
|---|---|---|---|---|
| 2019.04.01 දිනට ශේෂය | 5,500 | 3,800 | 3,000 | 12,300 |
| මිලදී ගැනීම | | | 500 | 500 |
| ප්‍රත්‍යාගණන අලාභ | (100) | | | 6100) |
| 2020.03.31 ට ශේෂය | **5,400** | **3,800** | **3,500** | **12,500** |
| සමුච්චිත ක්ෂය | | | | |
| 2019.04.01 දිනට ශේෂය | | 630 | 300 | 930 |
| වාර්ෂික ක්ෂය | | 380 | 161.25 | 542.25 |
| 2020.03.31 ට ශේෂය | - | 1,010 | 461.25 | 1471.25 |
| 2020.03.31 ට ධාරණ අගය | **5,400** | **2,790** | **3,038.75** | **11,228.75** |

5) **භාවිත අයිතිය ඇති වත්කම්**

| | |
|---|---|
| පිරිවැය | 927.040 |
| සමුච්චිත ක්ෂය | (231.760) |
| | **695.280** |

6) **වෙනත් ලැබිය යුතු දෑ**

ලැබිය යුතු ආයෝජන ආදායම් 50

7) **වෙනත් ගෙවිය යුතු දෑ**

| | |
|---|---|
| ඉදිරියට ලද කුලී | 40 |
| ණයකර පොළී | 10 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 950 |
| | **1,000** |

**පෙර වැඩ**

| විකුණුම් පිරිවැය | | බෙදාහැරීමේ | | පරිපාලන | | වෙනත් | | මූල්‍ය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආරම්.තො. | 400 | බොල් ණය | 60.00 | උපකරණ | 161.25 | තොග ක.හැ. | 10 | කල්බදු පො. | 50.704 |
| ගැනුම් | 6400 | හානි. අලාභ | 27.00 | වැටුප් | 700.00 | ප්‍රත්‍යා.අලාභ | 100 | ණයකර පො. | 120.00 0 |
| | **6800** | මෝ.ර. ක්ෂය | 380.00 | අධ.ගාස්තු | 500.00 | | **110** | | **170.704** |
| රක්ෂණය | (300) | භාවිත අයිතිය | | | | | | | |
| | **6500** | ඇති වත්. ක්ෂය | 231.75 | විගණන ගා. | 100.00 | | | | |
| | | විකුණුම් කොට. | 350.00 | පරි.වියදම් | 230.00 | | | | |
| | | | **1048.75** | | **1691.25** | | | | |



Copyright © www.e-thaksalawa.moe.gov.lk